අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

# නියාමන සහ ඇගයීම් නිලධාරී, වැඩසටහන් ගණකාධිකාරී සහ වැඩසටහන් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම

## ද්විතියික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන (SESIP)

**අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උක්ත SESIP වැඩසටහනෙහි ආංශික නියාමන හා තාක්ෂණික සහාය ඒකකයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

ද්විතියික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන මඟින් ශ්‍රී ලංකාවේ සමස්ත ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රතිසංස්කරණය සඳහා වූ රජයේ ප්‍රයත්නයට සහාය ලබා දේ. ඉහළ ආර්ථික අදාළත්වයක් සහිත විද්‍යාව, තාක්ෂණය, ගණිතය සහ වාණිජ විෂය ධාරාවන්හි විෂයමාලා, ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රමයන් හි විධිමත් ප්‍රතිසංස්කරණ සිදු කිරීම වයට ඇතුළත් වේ. කොවිඩ් -19 වසංගතය තුළින් උගත් පාඩම් මෙම වැඩසටහනට ඇතුලත් වන අතර ඩිජිටල් මාධ්‍ය හා තාක්ෂණය පදනම් කරගත් ඉගෙනුමට මෙමගින් සහාය ලබා දේ. එමෙන්ම, එමගින් කොවිඩ් -19 හි බලපෑම් සහ ඉදිරියේදී ඇති විය හැකි ඒ හා සමාන අනාගත වසංගත හමුවේ ප්‍රකෘති තත්වයට පත්වීමට අධ්‍යාපන පද්ධතියේ හැකියාව වැඩි දියුණු කරනු ලැබේ

වැඩසටහන් ණය ගිවිසුම සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ලේඛනය (PID) අනුව පාර්ශවකාර ආයතන විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නියාමනය කිරීම සඳහා සියලු සැලසුම් කටයුතු සිදු කිරීම නියාමන හා ඇගයීම් නිලධාරියා විසින් ඉටු කළ යුතු අතර ආසියානු සංවර්ධන බැංකුව, අධ්‍යාපන අමාත්‍යාංශය, භාණ්ඩාගාරය /විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අවශ්‍ය පරිදි අනෙකුත් ආයතන වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්තා සකස් කළ යුතුය. නියාමන හා ඇගයීම් නිලධාරියා ණය ගිවිසුම් හා ජාතික වැඩසටහන් කළමනාකරු (SESIP) වෙත වාර්තාකරණය ඇතුළු වාර්ෂික ප්‍රතිඵල පාදක ඉලක්ක (DLI) හා වැඩසටහනේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්ක අදාළ කාල සීමාව තුළ සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අනෙකුත් අදාළ රාජ්‍ය අමාත්‍යාංශයන් හි අදාළ ඒකක, ජාතික අධ්‍යාපන ආයතනය (NIE), විභාග දෙපාර්තමේන්තුව (DOE), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (EPD) සහ අනෙකුත් විවිධ අධ්‍යාපන ආයතන, පළාත් 09 හි අධ්‍යාපන බලධාරීන් (PEAs), ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය (TA) කණ්ඩායම සහ වැඩසටහන් ස්වාධීන සත්‍යාපන නියෝජිතායතනය (IVA) සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතුය. මෙයට අමතරව, ප්‍රතිඵල පාදක ඉලක්ක සමාලෝචනය හා ලුහා කර ගැනීම මෙන්ම වාර්තා කිරීම සඳහා අනෙකුත් අදාළ වැඩසටහන් ක්‍රියාකාරකම්වලට අනුකූලව වැඩසටහන් නියාමන ක්‍රමයක් සැලසුම් කිරීම, නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ.

වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ලේඛනයෙහි හා ණය ගිවිසුමෙහි සඳහන් සියලු මූල්‍ය කළමනාකරණ, විගණන හා ප්‍රසම්පාදන ඉලක්ක හා ක්‍රියාකාරකම් ලුහා කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ, අදාළ රාජ්‍ය අමාත්‍යාංශවල, ජාතික අධ්‍යාපන ආයතනයේ, විභාග දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් විවිධ අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ ආයතනවල ගිණුම් අංශ/ඒකක සමඟ මෙන්ම පළාත් 09 හි අධ්‍යාපන බලධාරීන් හා සම්බන්ධීකරණයෙන් මූල්‍ය වාර්තා, වාර්ෂික ගිණුම්, මුදල් ආපසු ගැනීමේ අයදුම්පත් සකස් කිරීම වැඩසටහන් ගණකාධිකාරී විසින් සිදු කළ යුතු අතර ජාතික වැඩසටහන් කළමනාකරු (SESIP) වෙත වාර්තා කළ යුතුය.

වැඩසටහන් නිලධාරී විසින් ප්‍රධාන වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලේඛනගත කිරීමේ කටයුතු හා බාහිර ආයතන වෙත ලිපි යැවීම, ප්‍රගති සමාලෝචන හා පාර්ශවකාර රැස්වීම් සඳහා වාර්තා සහ ඉදිරිපත් කිරීම් ආදී වැඩසටහනට අදාළ ලිපි ගනුදෙනු මෙහෙයවීම සිදු කළ යුතුය. මෙයට අමතරව, ජාතික වැඩසටහන් කළමනාකරු (SESIP) විසින් පවරනු ලබන වෙනත් ඕනෑම කාර්යයක් සම්බන්ධයෙන් වැඩසටහන් නිලධාරී විසින් යොමු වී කටයුතු කළ යුතුය.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | අනුමැතියට අනුව මට්ටම | සුදුසුකම් හා පළපුරුද්ද | වයස |
|---|---|---|---|---|
| නියාමන සහ ඇගයීම් නිලධාරී | 01 | PS4 (A කාණ්ඩය) | 1.විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රය තුළ සාර්ථකව සම්පූර්ණ කරන ලද මූලික උපාධියක්<br>හෝ<br>උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රය තුළ ලබා ගත් සුදුසුකමක්<br>හෝ<br>සුදුසුකම් ලබා ගත් පසු අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද සහිතව, අදාළ ක්ෂේත්‍රය තුළ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය සමාන වෘත්තීය සුදුසුකමක් | අවුරුදු 45-55 අතර විය යුතුය |
| වැඩසටහන් ගණකාධිකාරී | 01 | PS4 (A කාණ්ඩය) | 2.රජයේ දීප ව්‍යාප්ත සේවයේ III/II පන්තියේ හෝ ඊට ඉහල හෝ අදාළ ක්ෂේත්‍රය තුළ සමාන තත්වයේ නිලධාරියෙක්<br>හා<br>III/II පන්තියේ තනතුරේ අවම වශයෙන් අවුරුදු 09 ක පළපුරුද්ද | |
| වැඩසටහන් නිලධාරී | 01 | PS6 | ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ භාෂා ඇතුළුව සම්මාන සාමාර්ථ තුනක් (3) ලබමින් විෂයන් හය(6) කින් අ.පො.ස.(සා.පෙළ) සමත් වීම,<br>ඉංග්‍රීසි භාෂාව සඳහා විශිෂ්ට සම්මානයක් ලබා තිබීම වැදගත් වේ.<br>හා<br>පිළිගත් ආයතනයකින් ලේඛන කටයුතු පිළිබඳ පාඨමාලාවක් හෝ වරලත් ලේකම් ධූරයක් සඳහා හේතුවන විභාග සඳහා අදාළ හැදෑරීම් සිදු කර තිබීම.<br>හා<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද. | අවුරුදු 55 ට අඩු |

සුදුසුකම් සහ වේතන 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ මත පදනම් වේ. (www.treasury.gov.lk/web/management-services-department-circular/section/2019) රජයේ සේවාවලට අයත් නිලධාරීන් තාවකාලිකව අනුයුක්ත කිරීමේ (පූර්ණ කාලීනව මුදා හැරීම) පදනම මත බඳවා ගනු ලබන අතර රාජ්‍ය සේවයෙන් පිටත නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. මෙම පත්වීම ආරම්භයේ දී වසරක කාලයක් සඳහා ලබා දෙන අතර සාර්ථක කාර්ය සාධනය මත සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. අයදුම්කරුවන් විසින්ම සකස් කරන ලද අයදුම්පත් තම ජීව දත්ත සටහනක් සමඟ ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ විස්තර හා අධ්‍යාපන සහ

වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ද සහිතව ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතු වේ. එසේම, එහි පරිලෝකනය කරන ලද (scanned) පිටපත් විද්‍යුත් තැපෑලෙන් එවීම( adsec-admin@moe.gov.lk හෝ එම ලිපිනයටම ගෙනවිත් භාර දිය හැකිය. අයදුම්පත් භාර දීමේ අවසාන දිනය 2022 මාර්තු 25 වේ. වැඩසටහනේ නම (SESIP) සහ ඉල්ලුම් කරන ලද තනතුර අයදුම්පත එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලිවිය යුතුය. තනතුර සඳහා අයදුම් කරන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවල නිලධාරීන් තම අයදුම් පත අදාළ ආයතන ප්‍රධානීන් හරහා අයදුම්කරුව පූර්ණ කාලීන පදනමින් නිදහස් කළ හැකිද/නොහැකිද යන්න පිළිබඳ ඔවුන්ගේ නිර්දේශ සමඟ යොමු කළ යුතුය.

**මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල